ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය - 2024

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 වියාචනය කළ මතය

ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනත, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මා හට නොහැකි විය.

1.2 වියාචනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වියාචනය කළ මතයක් පළකරනු ලැබේ.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, යෝජනා ක්‍රමය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය යෝජනා ක්‍රමය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා යෝජනා ක්‍රමය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

යෝජනා ක්‍රමයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, යෝජනා ක්‍රමයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල යෝජනා ක්‍රමයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ යෝජනා ක්‍රමයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, යෝජනා ක්‍රමය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 88 ඡේදයට පටහැනිව සමාලෝචිත වර්ෂයේ දී ගොවීන්ගෙන් ලැබුණු වාරික ආදායම, ගොවි විශ්‍රාමිකයින්ගේ දායකත්ව ආදායම හා ආයෝජන පොලිය ඇතුළුව සමාලෝචිත වර්ෂය තුළ දී ලද රු.143,566,887 ක මුදල කාලපරිච්ඡේදයේ ආදායමක් ලෙස ගිණුම්ගත නොකර සමුච්චිත අරමුදලට ගලපා තිබුණු බැවින් එම ප්‍රමාණයෙන් ලාභය අවප්‍රමාණය වී තිබුණි.	දායකයින්ගෙන් අය කරන වාර මුදල් වයස අවුරුදු 60 සම්පූර්ණ වීමේදී ප්‍රතිලාභ ලෙස ගෙවිය යුතු බැවින්, අයකළ වාර මුදල් සහ ඊට අදාළ පොලී මුදලේ එකතුව මණ්ඩලයේ අරමුදල් ගිණුමට ගැලපීම් කර ඒ තුළින් අනාගතයේදී ගෙවිය යුතු වගකීම් සඳහා අරමුදල ශක්තිමත් කිරීම අපේක්ෂා කෙරේ. ආයුගණක තක්සේරුවක් සිදු කිරීමෙන් පසුව ගොවීන්ගේ වගකීම නිශ්චිතව හඳුනාගෙන එහිදී කිසියම් මුදලක් ඉතිරිවේ නම් එම මුදල ආදායමක් ලෙස හඳුනා ගැනීමට අපේක්ෂා කෙරේ.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතය අනුව වාරික ආදායම හා ආයෝජන පොලිය ආදායමක් ලෙස හඳුනාගත යුතුය.
(ආ)	මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේ දී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 7 හි 4 වන ඡේදය ප්‍රකාරව දායකයින්ගෙන් ලද රු.135,443,031 ක් වාරික මුදල් ආදායම මෙහෙයුම් ආදායම තුළ හඳුනා නොගැනීම නිසා මෙහෙයුම් ක්‍රියාකාරීත්වය තුළින් ජනනය වූ මුදල් ප්‍රවාහය එම ප්‍රමාණයෙන් අව තක්සේරු වී තිබුණු අතර රු.8,123,855 ක් ආයෝජන ආදායම තුළ හඳුනා නොගැනීම නිසා ආයෝජන ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ මුදල් ප්‍රවාහය එම ප්‍රමාණයෙන් අවතක්සේරු වී තිබුණි.	ගොවීන් ගෙවනු ලබන වාරික මුදල් මණ්ඩලය විසින් නැවත ගොවීන් වෙත ප්‍රතිලාභ ලෙස ගෙවිය යුතු බැවින් එම වාර මුදල් ලැබීම් මණ්ඩලීය මෙහෙයුම් ආදායමක් ලෙස හඳුනාගෙන නොමැත. වාර මුදල් ආයෝජන තුළින් ලද ආයෝජන වටිනාකම මූල්‍ය ක්‍රියාකාරකම් තුළ දක්වා ඇත. මෙම වාර මුදල් අය කිරීමෙන් ලැබෙන මුදල් ගොවීන් වෙත නැවත ගෙවීම සඳහා අරමුදල් රැස්කරන අතර එය මණ්ඩලයේ වගකීමකි. එම වාර මුදල් හා ආයෝජන තුළින් ලද මුදල් වලින් ජනිත වූ පොලී ආදායම එම අරමුදලට ගලපා ඇත.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව වාරික ආදායම හා ආයෝජන ආදායම සැලකිල්ලට ගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය.
(ඇ)	වර්ෂයේ ආරම්භක විශ්‍රාම වැටුප් වගකීමෙන් වර්ෂය තුළ ගෙවන ලද විශ්‍රාම වැටුප් මුදල අඩුකළ විට ලැබෙන අවසාන ශේෂයට සියයට 11 ක් එකතු කර විශ්‍රාම වැටුප් වගකීම ගණනය කරන ක්‍රමවේදයක් යෝජනා ක්‍රමය විසින් දිගින් දිගටම අනුගමනය කරමින් පැවතුණි. ඒ අනුව 2024 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය වූ රු.86,898,445,376 න් ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම වූ රු.4,845,125,008 අඩු කර එම ශේෂයට සියයට 11ක් වූ රු.9,025,865,240 එකතු කොට අවසාන ශේෂය වූ රු.91,079,185,608 විශ්‍රාම වැටුප් වගකීම	ආයු ගණක තක්සේරුව සිදු කිරීම සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කළද ඒ සඳහා ආයු ගණකවරයෙක් හෝ කිසිඳු ආයතනයක් ඉදිරිපත් නොවීය. ඒ අනුව අවසන් වරට සිදු කරන ලද ආයුගණක තක්සේරුව පදනම් කරගෙන අදාළ ගණනය කිරීම් සිදු කර ඇත.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව ආයුගණක තක්සේරුව සිදු කළ යුතුය.

වශයෙන් හඳුනාගෙන තිබුණි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 37 හි 59 වගන්තිය ප්‍රකාර අයුගණක තක්සේරු කිරීමකින් තොරව ඉහතින් සඳහන් කරන ලද ක්‍රමය අනුගමනය කරමින් ගණනය කරන ලද විශ්‍රාම වැටුප් වගකීමේ නිරවද්‍යතාවය පිළිබඳව සෑහීමකට පත් විය නොහැක.

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 නොවැම්බර් හා දෙසැම්බර් මාසවලට අදාළව ගොවි විශ්‍රාමිකයින්ගේ දායකත්ව ආදායම පිළිවෙලින් රු.8,970,200 ක් හා රු.8,969,200 ක් වූ අතර එම වටිනාකම් ගොවි විශ්‍රාමිකයින්ගේ දායකත්ව ආදායම් ගිණුමට බැර කිරීම වෙනුවට ගෙවිය යුතු විශ්‍රාම වැටුප් ගිණුමට බැර කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම රු.17,939,400 කින් අවතක්සේරු වී ඇති අතර ජංගම වගකීම් එම ප්‍රමාණයෙන් අධිතක්සේරු වී ඇත.	නිවැරදි කිරීමට කටයුතු කර ඇත.	විශ්‍රාමිකයින්ගේ දායකත්වය නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(ආ)	යෝජනා ක්‍රමයේ සමූහ ජීවිත රක්ෂණ ආවරණය මගින් වයස අවුරුදු 18-54 ත් අතර දායකයකු විශ්‍රාම වැටුප් ලැබීමට පෙර මරණයට පත් වීම, පූර්ණ හා අර්ධ බෙලහීනතාවයට පත් වීම, වෙනුවෙන් ගෙවීමට සිදුවන පාරිතෝෂික ගෙවීම සඳහා 2024 වර්ෂයේදී දායකයින් 266,297 ක් වෙනුවෙන් රු.15,977,820 ක අගයක් වෙන් කර තිබුණු අතර ඉන් 256,616 ක් අක්‍රිය දායකයින් වූ අතර ඔවුන්ගෙන් මිය ගිය ප්‍රමාණය හා සත්‍ය වශයෙන්ම අක්‍රිය වන දායකයින් ගණන තහවුරු කර ගැනීමකින් තොරව ඇස්තමේන්තු කර තිබුණි.	ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා ආයුගණක තක්සේරුවක් ලබා ගැනීම සමඟම මෙම අරමුදල සඳහාද ආයු ගණක තක්සේරුවක් සිදුකර පසුව මෙම වගකීම නිවැරදිව හඳුනා ගැනීමට කටයුතු කරන බව පෙන්වා දෙමි.	සක්‍රීය දායකයින් හඳුනාගෙන සමූහ ජීවිත රක්ෂණ වාරික සඳහා වෙන් කිරීම් කළ යුතුය.
(ඇ)	විශ්‍රාම වැටුප් වගකීම් ගිණුමට අමතරව සත්‍ය වශයෙන් ගෙවිය යුතු ලෙස හඳුනාගෙන ඇති විශ්‍රාම වැටුප් වගකීම රු.2,345,496,047 ක් වුවද එම වටිනාකම පදනම්ව ආයුගණක තක්සේරුවක් සිදු කර නොතිබූ බැවින් නිරවද්‍යතාව තහවුරු නොවිය.	යෝජනා ක්‍රමය සඳහා ආයුගණක තක්සේරුවක් ලබා ගැනීමට ප්‍රසම්පාදනය සඳහා ලංසු කැඳවීම සිදු කළද ඒ සඳහා කිසිදු පාර්ශවයක් ඉදිරිපත් නොවීම නිසා එය සිදුකළ නොහැකි විය. යෝජනා ක්‍රමයේ වගකීම් ගණනය කිරීමට හා ආයු ගණක තක්සේරු වාර්තා 2025 වර්ෂය තුළදී නැවත ප්‍රසම්පාදනයන් සිදු කර ලබාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ.	ආයුගණක තක්සේරුවක් කර විශ්‍රාම වැටුප් වගකීම ගණනය කළ යුතුය.

1.5.3 අරමුදලේ අඛණ්ඩ පැවැත්ම

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
යෝජනා ක්‍රමයේ මුළු වත්කම් රු.3,062,149,691 ක් සහ මුළු වගකීම් රු.94,351,635,618 ක් වූයෙන් වත්කම් ඉක්ම වූ වගකීම් රු.91,289,485,927 ක්ද, මුළු ජංගම වත්කම් රු.1,125,049,320 ක් සහ මුළු ජංගම වගකීම් රු.3,222,013,500 ක් වූයෙන් ජංගම වත්කම් ඉක්මවූ ජංගම වගකීම් රු.2,096,964,180 ක්ද වන අතර භාණ්ඩාගාරයේ දායකත්වයක් නොමැතිව යෝජනා ක්‍රමය පවත්වාගෙන යා නොහැකි තත්ත්වයක පවතින නිසා යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම ගැටළු සහගත වේ.	රජයේ දායකත්වය ලෙස මූලික ප්‍රාග්ධනය රු.මිලියන 750 ක අරමුදලක් යෙදවීමට යෝජනා කර තිබුණද මණ්ඩලය වෙත එය හිමි නොවීය. මේ වන විට විශ්‍රාම වැටුප් වගකීම වාර්ෂිකව වැඩිවන අතර, යෝජනා ක්‍රමය සඳහා අරමුදල් නොමැතිකමත්, වාරික මුදල් වැඩිකිරීමකින් තොරව අවස්ථා කිහිපයකදී රාජ්‍ය ප්‍රතිපත්ති අනුව ප්‍රතිලාභ වැඩිකිරීම හේතුවෙන් හා ක්‍රමිකව ගොවීන්ගේ දායකත්වය අඩුවීම තුළින් මෙම තත්ත්වය උදා වී ඇති අතර, සෑම වර්ෂයකදීම රජයේ අයවැය මගින් මුදල් වෙන්කර ගොවි විශ්‍රාම වැටුප් ගෙවනු ලබයි.	යෝජනා ක්‍රමය තුළ වත්කම් නොඉක්මවන ලෙස වගකීම් පවත්වා ගත යුතුය.

1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ගොවීන්ගේ ජීව දත්ත තොරතුරු යාවත්කාලීන නොකිරීම හේතුවෙන් මියගිය සහ වෙනත් හේතුන් මත හිමිකම් ලබාගැනීමට ඉදිරිපත් නොවන ගොවීන්ගේ විශ්‍රාම වැටුප දිගින් දිගටම තැපැල් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර තිබුණි. 2024 වර්ෂයේ දී ගොවීන් විසින් භාර නොගැනීම නිසා තැපැල් දෙපාර්තමේන්තුව විසින් ආපසු එවූ විශ්‍රාම වැටුප රු.469,255,211 ක් වූ අතර සමාලෝචිත වසර අවසානයට එම දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු ශේෂය රු.99,247,815 ක් විය. එම ශේෂයන් සෑදී ඇති ආකාරය හා එක් එක් ගොවීන් පිළිබඳ විස්තර ඇතුළත් තොරතුරු පද්ධතියක් නොවූ බැවින් ශේෂයන්හි නිවැරදිතාවය තහවුරු කර ගත නොහැකි විය.	නොගෙවූ විශ්‍රාම වැටුප් වලට අදාළව එම දායකයින්ගේ විස්තර ඇතුළත් වාර්තාවක් මණ්ඩලය වෙත එවන ලෙස දිස්ත්‍රික් දිසා ගණකාධිකාරීවරුන් දැනුවත් කර ඇති අතර, මේ වන විට මාසිකව විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ලබා නොගත් දායකයින්ගේ වාර්තාවක් ගෙන්වා ගැනීමට කටයුතු කර ඇත. තැපැල් දෙපාර්තමේන්තු ගණකාධිකාරීවරුන් දැනුවත් කර ප්‍රමාදයකින් තොරව අදාළ වාර්තා ගෙන්වා ගැනීමට කටයුතු කරනු ලැබේ.	ආපසු එවනු ලබන හිමිකම් නොපෑ මුදල් පිළිබඳ තොරතුරු යාවත්කාලීන කර ඒ අනුව වාරික නිදහස් කළ යුතුය.

1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනත			

(i) 6(1) වගන්තිය	අවුරුදු 60 සම්පූර්ණ වූ විට විශ්‍රාම වැටුපකට හිමිකම් ලැබිය යුතු වුවත් එම වයස සම්පූර්ණ කළ ගොවීන් හඳුනාගෙන ඔවුන්ට විශ්‍රාම වැටුප් ගෙවීම් කර නොතිබුණි.	යෝජනා ක්‍රමයට බඳවා ගැනීමේදී දායකත්වය සහ ප්‍රතිලාභ ලබා ගන්නා ආකාරය දැනුවත් කොට වාරමුදල් අයකර ගන්නා ලදී. ගොවීන් වෙත සහතික ඔප්පුව නිකුත් කර ඇති අතර, ප්‍රතිලාභ හිමිවන කාල සීමාව ඒ තුළ දක්වා ඇත. වයස අවුරුදු 60 සම්පූර්ණ වන ගොවීන් වෙත විශ්‍රාම වැටුප් ලබා ගැනීම පිළිබඳ දැනුවත් කර ලිපි යැවීමට හා වයස සම්පූර්ණ ගොවීන් වෙත විශ්‍රාම වැටුප් ගෙවීමට අදාළ සියලු ක්‍රියාමාර්ග මේ වන විට ගෙන ඇත.	වයස අවුරුදු 60 සම්පූර්ණ කළ ගොවීන් හඳුනාගැනීමට හා ඔවුන්ට හිමි විශ්‍රාම වැටුප් නොපමාව ගෙවීම් කළ යුතුය.
(ii) 12(ඇ) වගන්තිය	යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් ජීව දත්ත ඇතුළත් තොරතුරු පද්ධතියක් තිබුණද දත්ත පද්ධතිය යාවත්කාලීනව පවත්වාගෙන නොයාම නිසා අවශ්‍ය මූල්‍ය හා මෙහෙයුම් වාර්තා ලබා ගැනීමට නොහැකි වී තිබුණි. මේ නිසා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 528/03 ප්‍රකාරව යෝජනා ක්‍රමයට දායක වී ඇති මුළු ගොවීන් සංඛ්‍යාව 954,254 ක් වූ අතර තොරතුරු පද්ධතියෙහි ඇතුළත්ව ඇති සංඛ්‍යාව 871,425 ක් විය. ඒ අනුව ගොවීන් 82,829 ක වෙනසක් වුවද, එයට හේතු විගණනයට පැහැදිලි නොවීය.	1987 වර්ෂයේ සිට මෙම යෝජනා ක්‍රමය සඳහා දායකයින් බඳවා ගන්නා ලද අතර, ආරම්භයේදී මේ සඳහා දත්ත පද්ධතියත් නොපැවති අතර, මේ වන විට මධ්‍යගත තොරතුරු පද්ධතියක් සකස් කර ඇති අතර, ඉදිරියේදී නව යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී ගොවීන්ගේ සියලු තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් සකස් කිරීමට කටයුතු කරනු ලැබේ.	යෝජනා ක්‍රමයේ ජීව දත්ත තොරතුරු පද්ධතිය යාවත්කාලීන කර පවත්වා ගත යුතුය.
(iii) 12(ඇ) වගන්තිය	යෝජනා ක්‍රමය පිළිබඳව සමීක්ෂණ ඇගයුම් හා සමාලෝචනය කර මෙහෙයුම් රීතිවල වෙනස්කම් ඇති කිරීම සිදු කළ යුතු වුවත්, ගොඩනගාගන්නා ලද නීතියක් රීතියක් හෝ රෙගුලාසියක් නොමැතිව හිමිකම් නොපෑ විශ්‍රාම වැටුප ආපසු ගෙවීමේ දී අර්ධ වර්ෂයකට සියයට 3.32 ක පොලී ප්‍රතිශතයක් ශුද්ධ වාරික මුදලට අමතරව ගණනය කර තිබුණි.	දායකයින් විසින් දායක මුදල් නිසි පරිදි මණ්ඩලය වෙත ගෙවා නොමැති අවස්ථාවලදී එම මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පොලී අනුපාත යටතේ ගණනය කර දායක මුදල්ද සමඟ ගෙවීම සඳහා නෛතික ප්‍රතිපාදන පවතින අතර, ඒ අනුව අර්ධ වාර්ෂිකව සියයට 3.32 පොලී ප්‍රතිශතයක් ශුද්ධ වාරික ගෙවීමේදී පොලී අනුපාතය ලෙස ගණනය කර ගෙවීම් සිදු කර ඇත.	ශුද්ධ වාරික මුදල මත පොලිය ගණනය කිරීමට රීතියක් ගොඩනගාගත යුතුය.
(iv)15(1) වගන්තිය	පිළිවෙලින් වාරික 5 ක් ගෙවීම පැහැර හැර ඇති දායකයෙකුට සහතිකය යටතේ වූ ප්‍රතිලාභ අහිමි කිරීම දායකයා වෙත දැන්වීමට	වාරික 05 ක් ලෙස සලකන්නේ වගා කන්න 05 කි. එනම් වසර දෙකහමාරකි. මෙම කාලපරිච්ඡේදය තුළදී ගෙවීම් සිදු	වාරික මුදල් නිසිපරිදි නොගෙවීම මත ප්‍රතිලාභ අහිමි වීම දායකයා

		මණ්ඩලයට බලය ඇතත් ප්‍රතිලාභී පාර්ශවය විසින් පිළිවෙලින් වාරික 5 ක් ගෙවීම පැහැර හරිනු නොලබන නමුත් කඩින් කඩ හෝ වාරික 5 ක් නොගෙවූ ප්‍රතිලාභීන් ද ඔප්පුව කඩකළා සේ සලකා විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අහිමි කර තිබුණි.	නොකරන ලද ගොවීන් වෙත වාරික ගෙවීම සඳහා සහන කාල පරිච්ඡේදයන් මණ්ඩලය විසින් ලබා දී ඇති අතර එම කාල සීමාව තුළදීද අඛණ්ඩව වාරික 05 ක් නොගෙවන ලද ගොවීන්ගේ ප්‍රතිලාභ ගෙවීම සිදු කර නොමැත. නමුත් අවසන් වාරිකය ගෙවීමට නියමිත දිනය වන විට වාරික ගෙවා ඇති දායකයින් සඳහා විශ්‍රාම වැටුප අහිමිවීමක් නොවන අතර, එම දායකයින් සඳහා ගෙවීම් කිරීමට උපදේශක කාරක සභාවේ නිර්දේශය ලබාගෙන ඇත.	දැනුවත් කළ යුතුය.
	(v) 27(1) වගන්තිය	විෂයභාර අමාත්‍යවරයාගේ සහ මුදල් විෂයභාර අමාත්‍යාවරයාගේ එකඟතාවය මත, යෝජනාක්‍රමය විසින් ලබා ගන්නා ණය ප්‍රමාණය තීරණය විය යුතු වුවත් එවැනි එකඟතාවයක් ලබානොගෙන කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයෙන් මෙම යෝජනාක්‍රමයට රු.295,230,442 ක ණය මුදලක් ලබාගෙන තිබුණි. 2024 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු පොලියද ඇතුළත් මුළු ණය ශේෂය රු.552,668,504 ක් විය.	ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා භාණ්ඩාගාරයෙන් ලද මුදල් හා හිඟ මුදල් සඳහා ධීවර විශ්රාම වැටුප් හා කෘෂි රක්ෂණ අරමුදලෙන් මුදල් යොදවා ගන්නා ලෙසත්, පසුව එම අරමුදල් පියවන ලෙසත් දැනුම් දී ඇත. ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිතව මණ්ඩලය අනෙකුත් අතිරික්ත අරමුදල් ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා යොදා ගෙන ඇත. එසේ ලබා ගත් මුදලින්, ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයෙන් ලබා ගත් මුදල් ගෙවා අවසන් කර ඇති අතර, කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමයෙන් ලබා ගත් මුදල් ක්‍රමිකව ගෙවීම් සිදු කරමින් පවතින අතර, ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ඇත.	විෂයභාර සහ මුදල් අමාත්‍යාවරයාගේ එකඟතාවය මත, යෝජනා ක්‍රමයට ලබාදෙන ණය පිළිබඳ තීරණය කළ යුතුය.
(ආ)	ගොවි විශ්‍රාම වැටුප් සහතික ඔප්පුවේ 6 වගන්තිය	ගෙවා ඇති අර්ධ වාර්ෂික දායක මුදල් ප්‍රමාණයෙන් සියයට 75 ක් ලැබී තිබේ නම් මණ්ඩලය විසින් තීරණය කරන පරිදි නියමිත විශ්‍රාම වැටුපට වඩා අඩු විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම් ඇතත් එම දායකයින් සඳහා විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අහිමිකර තිබුණි.	ගෙවා ඇති අර්ධ වාර්ෂික දායක මුදල් ප්‍රමාණයෙන් සියයට 75ක් ගෙවා ඇති දායකයින් සඳහා සාමාන්‍ය පරිදි අනුපාතික විශ්‍රාම වැටුපක් ගෙවනු ලැබේ. එසේ නියමිත වාරික මුදල් ගෙවා නොමැති එහෙත් සියයට 75ක් වාරික මුදල් ගෙවා ඇති දායකයින් සඳහා අනුපාතික විශ්රාම වැටුපක් ගෙවීමට අදාළව උපදෙස් ලබා ගැනීම සඳහා උපදේශක කාරක සභාවට	අර්ධ වාර්ෂික දායක මුදල් ප්‍රමාණයෙන් සියයට 75 ක් ලැබීම මත විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අහිමි නොකළ යුතුය.

		ඉදිරිපත් කර ඉදිරි කටයුතු සිදු කිරීමට අපේක්ෂා කෙරේ.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.4,161,587,879 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.4,441,863,852 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.280,275,973 ක ඌනතාවයේ අඩුවීමක් නිරීක්ෂණය විය. මෙම ඌනතාවයේ අඩුවීම සඳහා ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම් කිරීම සඳහා භාණ්ඩාගාරයෙන් ලද මුදල් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	යෝජනා ක්‍රමයට අනුමත කාර්ය මණ්ඩලයක් නොසිටින අතර මණ්ඩලයෙහි මුළු සේවක වැටුප් වියදමින් හා අනිකුත් පරිපාලන වියදම් වලින් ද සියයට 50 ක් බැගින් වූ ප්‍රතිශතයක් යෝජනාක්‍රමයේ වියදම් ලෙස හරකර තිබුණි. හිමිකම් නොපෑ විශ්‍රාම වැටුප් ආපසු ගෙවීමේ දී ප්‍රතිලාභියාගෙන් ලැබෙන සෑම වාරිකයකින්ම රු.15 බැගින් පරිපාලන වියදම් වශයෙන් ද ගොවියා නිසි පරිදි ගෙවූ එක් වාරිකයකට රු.30 බැගින් රක්ෂණ ගාස්තුවක් ද ගොවියාට ආපසු ගෙවන මුදලින් රු.150 ක් යලි රක්ෂණ ගාස්තුවක් ලෙස ද අඩු කර ගොවියාට ආපසු ගෙවන මුදල තීරණය කර තිබුණ ද මේ සඳහා කිසිඳු රීතියක් හෝ අනුමත කර ගෙන නොතිබුණි.	යෝජනා ක්‍රමය පවත්වාගෙන යාම සඳහා මණ්ඩලය විසින් දරනු ලබන වියදම් ඍජුවම හඳුනාගත නොහැකි අවස්ථාවලදී යෝජනා ක්‍රම අතර එම වියදම් බෙදා හැරීම සඳහා 2018/10/15 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 401/4 මගින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇති අතර, ඒ අනුව ඒ ඒ යෝජනාක්‍රමය අතර වියදම් විභජනය කර ඇත.	අනුමත රීතියක් නොමැතිව වාරික මුදලින් වෙනත් අය කිරීම් නොකළ යුතුය.
(ආ)	2007 දෙසැම්බර් 31 දිනට ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ පැවති සමූහ ජීවිත රක්ෂණ අරමුදලේ සහ එයට අදාළ ආයෝජනය වූ රු.251,547,146 ක ශේෂය කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ ගිණුමට මාරු කර තිබුණි. යෝජනා ක්‍රමයේ මුදල් අවශ්‍යතාව සඳහා 2010, 2011 සහ 2012 වර්ෂවලදී සමූහ ජීවිත රක්ෂණ අරමුදලෙන් රු.295,230,442 ක ණය මුදලක් ලබාගෙන තිබුණු අතර ඒ සඳහා 2024 වර්ෂය දක්වා වූ සමුච්චිත පොලිය රු.469,030,456 ක් විය. සමාලෝචිත වර්ෂයේ යෝජනා ක්‍රමයේ පරිපාලන වියදම් සඳහා භාණ්ඩාගාරයෙන් ලද රු.249,630,000 ක මුදලින් රු.12,596,498 ක මුදලක් යොදාගෙන ණය මුදලින් කොටසක් වශයෙන් පියවා තිබුණි. මේ අනුව ජීවිත රක්ෂණ අරමුදලෙහි ආයෝජනය ණය මුදලක් බවට පත් වී තිබුණි.	ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ මරණ හා බෙලහීන ප්‍රතිලාභ ගෙවීම වෙනුවෙන් රක්ෂණ යෝජනා ක්‍රමයක් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ක්‍රියාත්මක වූ අතර, එය පසුව කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලදී. 2010 වර්ෂයේදී ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ ගෙවීම් කටයුතු සඳහා මුදල් අමාත්‍යාංශයේ උපදෙස් පරිදි මෙම අරමුදලේ මුදල් යොදාගෙන ඇති අතර, එම මුදල් ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයෙන් නැවත අය කරගැනීමේ පදනමින් ලබා දී ඇති අතර, එම ණය මුදල ක්‍රමිකව පියවීමට කටයුතු කරනු ලැබේ.	අවශ්‍යතාවය සොයා බලා ඒ අනුව අරමුදල් සපයා ගත යුතු අතර ආර්ථිකමය වාසි සැලසෙන පරිදි නිවැරදි තීරණ ගත යුතුය.

(ඈ)	මාවිල් ආරු සොරොව්ව වැසීම නිසා ගොවීන් වෙත වගා හානි වන්දි ගෙවීම සඳහා රු. මිලියන 7 කට වැඩි මුදලක් පෙර වර්ෂයේ දී ගෙවීම් කර තිබුණු අතර මේ සම්බන්ධව ගොනු කරන ලද නඩුව නීතිපති උපදෙස් සඳහා 2007 නොවැම්බර් 30 දින යොමුකර තිබුණු අතර කිසිදු පසුවිපරමක් සිදුකර නොතිබුණි.	මෙම නඩුවේ කටයුතු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබන අතර අදාළ නඩුව පිළිබඳව නීතිපති දෙපාර්තමේන්තුවෙන් කරුණු විමසීමට කටයුතු කරනු ලැබේ.	ගොනු කරන ලද නඩු සම්බන්ධයෙන් පසුවිපරම් කළ යුතුය.
(ඇ)	2007 සිට 2022 වර්ෂය දක්වා නොගෙවූ ගොවි විශ්‍රාම වැටුප්, මූල්‍ය ප්‍රකාශනවල වගකීමක් ලෙස හඳුනා නොගෙන ගොවි විශ්‍රාම වැටුප් වියදමට එරෙහිව කපාහැර තිබූ වටිනාකම රු.1,136,598,066 ක් වූ අතර 2023 වර්ෂයේ නොගෙවූ විශ්‍රාම වැටුප් වගකීම රු.340,373,793 ක් ද, 2024 වර්ෂයේ නොගෙවූ විශ්‍රාම වැටුප් වගකීම රු.568,503,026 ක් දායකයන් වෙත ගෙවීමට කටයුතු කර නොතිබුණි**.** එම විශ්‍රාම වැටුප් විශ්‍රාමිකයින් විසින් ලබා නොගන්නා බව තහවුරු කර ගෙන එම මුදල් නැවත මහා භාණ්ඩාගාරයට යැවීමට කටයුතු කර නොතිබුණි.	ගොවීන් විසින් විශ්‍රාම වැටුප් ලබා ගැනීම සඳහා අදාළ මාසය තුළදීම තැපැල් කාර්යාල වෙත නොපැමිණියද ඊට පසු මාස වලදී අදාළ හිමිකම ලබා ගැනීමට පැමිණෙන අවස්ථා පවතී. ගොවීන් එම මුදල් ඉල්ලුම් කරන අවස්ථාවලදී නැවත ලබා දිය යුතුවේ. එබැවින් මෙම වටිනාකම මණ්ඩලයේ අරමුදල තුළ රඳවා ගැනීමට කටයුතු කර ඇත.	ගොවීන් හිමිකම් නොපෑ විශ්‍රාම වැටුප භාණ්ඩාගාරයට යැවීමට කටයුතු කළ යුතුය.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අනුගාමී වාරික 5 ක් කඩ කර ඇති විට ඒ බව දැනුවත් කර ඔප්පුව සක්‍රිය කිරීම සඳහා අවශ්‍ය පහසුව සලසා නොමැති නිසා නියමිත වයස සම්පූර්ණ වූ පසු විශ්‍රාම වැටුප් සඳහා 2021 වර්ෂයේදී අයදුම් කළ දායකයින් 1,127 දෙනෙකුටද, 2022 වර්ෂයේදී දායකයින් 2,226 දෙනෙකුටද, 2023 වර්ෂයේ දායකයින් 715 දෙනෙකුටද, 2024 වර්ෂයේදී දායකයින් 775 දෙනෙකුටද විශ්‍රාම වැටුප් නොගෙවා ශුද්ධ වාරික මුදල් ගෙවීම් කර තිබුණි.	පනතේ 15 (1) ඡේදය අනුව "පිළිවෙලින් වාරික පහක් ගෙවීම පැහැර හරින යම් දායකයෙකුට, ඔහු වෙත නිකුත් කරන ලද සහතිකය යටතේ වූ ප්‍රතිලාභ අහිමිවිය යුතුය". තවද දායකයෙකු වෙත නිකුත් කරන වාරික මුදල් සටහන් පොතෙහි උපදෙස් අංක 04 යටතේ වාරික 05ක් ගෙවීම පැහැර හැරියහොත් මෙම යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ ඔහුට අහිමි වන අතර ගිවිසුමද අවලංගු වන බව සඳහන් කර ඇත. එසේ වුවද දායකයින් ගෙවිය යුතු වාරික සංඛ්‍යාවෙන් සියයට 75ට වඩා ගෙවීම් කළ ගොවීන් සඳහා අඩු කළ විශ්‍රාම වැටුපක් හා එසේ ගෙවීම් සිදුකර නොමැති ගොවීන් සඳහා මණ්ඩලය විසින් ශුද්ධ වාරික ගෙවීම සිදුකරනු ලබයි. ඒ අනුව එම ගොවීන් සඳහා ශුද්ධ වාරික ගෙවීම සිදුකර ඇත.	අනුගාමී වාරික 5 ක් කඩ කර ඇති විට ඒ බව දැනුවත් කර ඔප්පුව සක්‍රිය කිරීම සඳහා අවශ්‍ය පහසුව සැලසිය යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂය අවසන් වන විට විශ්‍රාම වැටුප් හිමිකම් සඳහා අයදුම්පත් 7,057 ක් ඉදිරිපත් වුවද ඉන් අයදුම්පත් 1,575 කට ප්‍රතිලාභ ලබා දීමට යෝජනා ක්‍රමය අපොහොසත්ව තිබුණි.	සමාලෝචිත වර්ෂය තුළදී ලද අයදුම්පත් අතරින් විගණන විමසුමෙහි දක්වා ඇති ගොවි විශ්‍රාම වැටුප් අයදුම්පත්වල අඩුපාඩු පැවතීම නිසා අදාළ ගෙවීම් සිදු නොකරන ලද අතර, එම අඩුපාඩු නිවැරදි කර නැවත	විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ නොපමාව ගෙවීමට කටයුතු කළ යුතුය.

		එවන ලෙස දිස්ත්‍රික් කාර්යාල වෙත යවා ඇති අතර, අඩුපාඩු නිවැරදි කර නැවත එවීමෙන් පසු එම ගොවීන් සඳහා ගෙවීම් සිදුකර ඇති අතර මේ වන විට ගෙවීම් සිදුකළ යුතු අයදුම්පත් සංඛ්‍යාව 321කි.	
(ඇ)	2021 වර්ෂයේ නව බඳවාගැනීම් ආරම්භ කිරීමෙන් පසු, 2025 ජනවාරි 09 දින වන විට, එකවර මුදල් ගෙවූ දායකයින් 1,205 දෙනෙකු ද, අර්ධ වාර්ෂික වාරික මුදල් ගෙවන දායකයින් 2,210 දෙනෙකු ද, මාසික වාරික මුදල් ගෙවන දායකයින් 1,477 දෙනෙකු යෝජනා ක්‍රමයේ දායකත්වය ලබා ගෙන සිටි අතර ඒ ඒ දායකයින්ට අනුව දායක මුදල් අයවීම් හඳුනාගැනීමටත්, දායකයින්ගේ සක්‍රීය හෝ අක්‍රීය බව හඳුනාගැනීමටත්, අක්‍රීය වූ දායකයින්ගේ වාරික මුදල් භාර නොගැනීමටත් හැකිවන පරිදි පවතින තොරතුරු පද්ධතිය හෝ ලිපිගොනු පවත්වාගෙන ගොස් නොතිබුණි.	ගොවීන් විසින් වාර මුදල් ගෙවීමේදී බැංකුව වෙත ස්ථාවර නියෝග මඟින් හා Bill Payment ක්‍රමය අනුව පසු වාර මුදල් ගෙවීම සිදු කරනු ලබන අතර, වාර මුදල් ගෙවීම් සිදු කරනු ලබන ගොවීන්ගේ කේවල ගිණුම් යාවත්කාලීන කිරීම සඳහා Excel මෘදුකාංගය යොදාගෙන දත්ත පද්ධතිය දෛනිකව යාවත්කාලීන කිරීමට කටයුතු කර ඇත. තවද මහජන බැංකුව මගින් ලැබෙන බැංකු වාර්තා මගින් නිවැරදිව ඔප්පු අංක ලබා ගැනීම සඳහා මහජන බැංකුව විසින් පද්ධතිය නවීකරණය කර ඇත. එමගින් වාරික මුදල් දිනපතා දායකයින්ගේ කේවල ගිණුම් වෙත යාවත්කාලීන කරනු ලැබේ. ගොවීන් වෙත අදාළ දැනුම් දීමේ කටයුතු ගොවි විශ්‍රාම වැටුප් අංශය විසින් සිදුකරනු ලැබේ.	වාරික මුදල් නියමිත පරිදි ප්‍රේෂණය නොකරන හා ඔප්පු කඩ කිරීම් හඳුනා ගැනීමට ක්‍රමවේද හඳුන්වා දිය යුතුය.
(ඈ)	2012 වර්ෂයට පෙර බඳවාගත් දායකයන්ගේ තොරතුරු පවත්නා දත්ත පද්ධතියට ඇතුළත් නොකිරීම සහ ඔවුන්ගේ ප්‍රේෂණ සඳහා ලදුපත්,වාරික ගෙවීම් විස්තර ආරක්ෂිතව පවත්වා නොතිබීම හේතුවෙන් ආදායමේ සම්පූර්ණත්වය සහ නිවැරදිභාවය ප්‍රේෂණය විගණනයේදී සනාථ නොවීය.	අදාළ වාර්තා නිසි පරිදි ගොනුගත කර ගෙවීම් සිදුකිරීමේදී වාරික සටහන් පොත තුළ යාවත්කාලීන වූ දත්ත භාවිතා කර ගෙවීම් සිදුකරනු ලබන අතර, නව යෝජනා ක්‍රමය යටතේ වාරික ගෙවීම් යාවත්කාලීනව පවත්වාගෙන යාමට ක්‍රියාමාර්ග ගෙන ඇත.	2012 වර්ෂයට පෙර බඳවාගත් දායකයන්ගේ තොරතුරු හා ප්‍රේෂණ පවත්නා දත්ත පද්ධතියට ඇතුළත් කර යාවත්කාලීන කළ යුතුය.
(ඉ)	2008 වර්ෂයේදී ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට නව දායකයින් බඳවා ගැනීම් නතර කිරීම හා 2012 හා 2014 වර්ෂවල ගොවි විශ්‍රාම වැටුප් නොගෙවීම නිසා යෝජනා ක්‍රමය පිළිබඳ ගොවීන් තුළ තිබුණු විශ්වාසය කඩවීම හේතුවෙන් ගොවීන් විසින් දායක මුදල් ගෙවීම් නතර කර දැමීම නිසා නොකඩවා වාරික 5 ක් ගෙවීම පැහැර හැර ඇති ගොවීන් 918 කට අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංක 528/03 හා 543/01 මගින් විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් මත විශ්‍රාම වැටුප් ගෙවීමට කටයුතු කර තිබුණි. නමුත් විශ්‍රාම වැටුප ගණනය කිරීමේදී ගෙවිය යුතු මුළු වාරික ප්‍රමාණයම ගෙවා ඇති අනෙකුත් ගොවීන් සඳහා විශ්‍රාම වැටුප අහිමි නොකිරීමට හා අඩු කළ විශ්‍රාම වැටුපක් සකස් නොකිරීමට පොදු	විගණන නිරීක්ෂණ අනුව නියමිත වාරික වලින් සියයට 75ක් ගෙවා අවසන් කර ඇති නමුත් පිළිවෙලින් වාරික 05 ගෙවීම පැහැර හැරීම නිසා දායකත්වය අවලංගුවී ඇති දායකයන් සඳහාද විශ්‍රාම වැටුප් ලබා දීමට සහනයක් සැලසීම සඳහා 2025.03.24 දින පැවති 546 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කර ඇත. මෙය උපදේශක කාරක සභාවට ඉදිරිපත්කර අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කරනු ලැබේ.	සියලුම වාරික මුදල් ගෙවූ දායකයින්ට විශ්‍රාම වැටුප් ප්‍රදානයේදී අදාල හිමිකම් අහිමි නොවන අකාරයට පොදු එකඟතාවයක් ඇති කර ගෙන කටයුතු කළ යුතුය.

	එකඟතාවයක් ලබා නොගැනීම නිසා සියලුම වාරික ගෙවූ එහෙත් මණ්ඩලයේ ගණනය කිරීම අනුව නොකඩවා වාරික 5 ක් ගෙවීම පැහැර හැර ඇති අනෙක් ගොවීන්ට විශ්‍රාම වැටුප අහිමි කර හා අඩු කළ විශ්‍රාම වැටුපක් සකස් කර තිබුණි.		
(ඊ)	දායකයා විසින් ගෙවිය යුතු වාරික ප්‍රමාණය හෝ එම ප්‍රමාණය ඉක්මවා වාරික මුදල් ගෙවා තිබුණු නමුත් අවසාන වාරිකය නියමිත දිනට ගෙවා නොතිබීම නිසා පරීක්ෂා කළ ගොවීන් 20 ක් අතරින් ගොවීන් 3 දෙනෙකුට අඩු කළ විශ්‍රාම වැටුපක් ගෙවීමට නිර්දේශ කර තිබුණි. අවසන් වාරිකය නියමිත දිනට නොගෙවීම හේතුවෙන් අඩු කළ විශ්‍රාම වැටුපක් හිමිවන බව මුදල් භාර ගන්නා නිලධාරීන් දැනුවත් වී නොතිබුණි. එසේම අවසන් වාරිකය ගෙවිය යුතු දිනය පසුවීම හේතුවෙන් තවදුරටත් මුදල් අය කර නොගතයුතු දායකයින්ගේ නම් ලැයිස්තුවක් මුදල් අය කර ගන්නා ආයතනවලට නිකුත් කර නොතිබුණි.	අවසාන වාරිකය නියමිත දිනට ගෙවීම් නොකරන ලද ගොවීන් සඳහා සහන කාලයක් යටතේ ගෙවීම් කරන වාරික ප්‍රමාණය වලංගු වාරික ලෙස සලකා ගෙවීම් සිදුකිරීමට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ.	දායකයා විසින් ගෙවිය යුතු වාරික ප්‍රමාණය හෝ එම ප්‍රමාණය ඉක්මවා වාරික මුදල් අයනොවන අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් සකස් කළ යුතුය.
(උ)	ගොවි විශ්‍රාමිකයෙකු මියගිය බව හඳුනා ගැනීම සඳහා තැපැල් කාර්යාල මගින් ලබා දෙන තොරතුරු හැර, මිය ගිය බවට නිශ්චිත වශයෙන් තහවුරු කර ගැනීමේ ක්‍රමවේදයක් අරමුදල සතු නොවූ අතර එවැනි මියගිය බවට වාර්තා වූ විශ්‍රාමිකයින්ගේ නම්, අදාළ ගෙවීම් ලේඛන වලින් ඉවත්කිරීම කර තිබුණි. 2018 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා එසේ ඉවත් කළ විශ්‍රාමිකයින් සංඛ්‍යාව 21,937 ක් විය.	ගොවි විශ්‍රාම වැටුප්ලාභීන් වෙත ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම සිදු කරනු ලබන්නේ තැපැල් කාර්යාල මඟින් වන අතර, අදාළ ගෙවීම් නතර කිරීම සඳහා තැපැල් ස්ථානාධිපතිවරුන්ගේ නිර්දේශය පිළිබඳව සලකා බලන අතරම අදාළ දායකයින් විශ්‍රාම වැටුප් මාස 6ක් හෝ ඊට අධික කාලයක් ලබා ගැනීමට කටයුතු කර නොමැති නම් ඉහත නිර්දේශය ද සලකා බලා අදාළ ගෙවීම් නතර කිරීමට කටයුතු කරනු ලැබේ.	විශ්‍රාම වැටුප් හිමි පුද්ගලයන්ගේ ජීව දත්ත තොරතුරු මගින් තහවුරු කර ගෙන අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පමණක් ගෙවීම් ලේඛන වලින් ඉවත් කළ යුතුය.
(ඌ)	ගොවි විශ්‍රාම වැටුප් යෝජනාක්‍රමය සඳහා දායකයින් බඳවා ගැනීම යන මැයෙන් 2022 ඔක්තෝබර් 26 දිනැති හා අංක 01/2022 දරන කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ සභාපතිවරයා විසින් නිකුත් කළ අභ්‍යන්තර චක්‍රලේඛයේ 9 ඡේදය ප්‍රකාරව යෝජනා ක්‍රමයට දායක වන සෑම දායකයෙකු සඳහාම සහතික ඔප්පුවක් නිකුත් කළ යුතු වුවත් 2021 වර්ෂයේ සිට 2025 වර්ෂයේ ජුනි මාසය දක්වා දායකත්වය ලබා ගත් දායකයින් 6,285 ක් අතරින් දායකයින් 848 දෙනෙකු සඳහා දායක ඔප්පු නිකුත් කර නොතිබුණි.	ගොවි විශ්‍රාම වැටුප් පද්ධතියට තොරතුරු ඇතුළත් කිරීමට අදාළ පුහුණුව හා උපදෙස් දිස්ත්‍රික් කාර්යාල වෙත ලබා දී ඇත. ඒ අනුව නිවැරදිව තොරතුරු ලබාදී ඇති දායකයින්ගේ ඔප්පු නිකුත් කිරීමට කටයුතු කර ඇති අතර දායකයින් විසින් අදාළ ලේඛන ඉදිරිපත් කර නොමැති අවස්ථාවලදී ඔප්පු නිකුත්කර නොමැති අතර, එවැනි දායකයින් දැනුවත් කර අදාළ ලේඛන ගෙන්වා ගැනීමට කටයුතු කරනු ලබන අතර ඔප්පු නිකුත් කිරීමේ ප්‍රමාදයක් නොමැති බව පෙන්වා දෙමි.	විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ සෑම දායකයකුටම සහතික ඔප්පුව ප්‍රමාදයකින් තොරව ලබා දිය යුතුය.
(එ)	1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනතේ 12 වන වගන්තිය සහ 1999 අංක 20 දරන කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ පනතෙහි 33 (ඇ) වගන්තිය ප්‍රකාරව කෘෂිකර්ම රක්ෂණ	ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී මහා භාණ්ඩාගාරයෙන් රු.මිලියන 249 ක මුදලක් හා වෙනත් ආදායම් ලෙස රු.මිලියන 1ක් හා ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා	පනත ක්‍රියාත්මක කිරීම මණ්ඩලයේ කාර්යයක් වන බැවින් ඒ සඳහා වෙනමම

	මණ්ඩලය විසින් අමාත්‍යවරයා විමසා මේ යෝජනා ක්‍රමය මෙහෙයවිය යුතු බව දක්වා තිබුණද, කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ මණ්ඩලය විසින් එම කටයුතු වෙනුවෙන් රු.253,136,873 ක මුදලක් ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ ආදායමෙන් වෙන් කර ගෙන තිබුණි.	රු.මිලියන 2 ක ගොවීන්ගේ දායකත්වයක්ද මෙම අදායම තුළ ඇතුළත් බව පෙන්වා දෙමි.	ප්‍රතිපාදනයන් වෙන් නොකල යුතුය.
(ඒ)	වයස අවුරුදු 60 සම්පූර්ණ වන අවස්ථාවේදී විශ්‍රාම වැටුප් ඉල්ලුම් කිරීමට අදාළ අයදුම්පත් ගොවීන් විසින්ම තම සහතික ඔප්පු පරීක්ෂා කර අදාළ කාලය තුළ මණ්ඩලය වෙත ගෙනැවිත් භාරදිය යුතු බවට ගොවීන් දැනුවත් කර නොමැති අතර ගොවි දායකයා විසින් විශ්‍රාම වැටුප් ලබා ගැනීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීමට ප්‍රමාද වුවහොත් ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන සමඟ ප්‍රමාදය සඳහා හේතු සඳහන් ලිපියක් ගොවියාගෙන් ලබා ගෙන තිබුණි. එසේම වයස අවුරුදු 60 සම්පූර්ණ වූ නමුත් 2024 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම වැටුප් නොලබන සංඛ්‍යාව නිවැරදිව හඳුනාගෙන නොතිබුණි.	බඳවා ගැනීමේදී යෝජනා ක්‍රමයට දායකත්වය සපයන ආකාරය සහ ප්‍රතිලාභ ලබා ගන්නා ආකාරය පිළිබඳව ගොවීන් දැනුවත් කරන ලදී. මණ්ඩලය විසින් ගොවීන් වෙත සහතික ඔප්පුව නිකුත් කර ඇති අතර, ගොවීන් වෙත ප්‍රතිලාභ හිමිවන කාල සීමාව ඒ තුළ දක්වා ඇත.වයස අවුරුදු 60 සම්පූර්ණ වන ගොවීන්ට වෙත විශ්‍රාම වැටුප් ලබා ගැනීම පිළිබඳ දැනුවත් කර ලිපි යැවීම මේ වන විට සිදු කරමින් පවතී. මේ අනුව වයස අවුරුදු 60 සම්පූර්ණ වූ විගසම ගොවීන් වෙත විශ්‍රාම වැටුප් ගෙවීමට අදාළ ක්‍රියාමාර්ග මේ වන විට ගෙන ඇත.	වයස අවුරුදු 60 සම්පූර්ණ වන අවස්ථාවේදී ගොවීන් සඳහා විශ්‍රාම වැටුප් ලබා දීම කළ යුතුය.
(ඔ)	යෝජනාක්‍රමයේ පරිපාලනය, කළමනාකරණය, මෙහෙයවීම සහ ක්‍රියාවේ යෙදවීමට අදාළ කරුණු පිළිබඳව මණ්ඩලය වෙත උපදෙස් ලබාදීම සඳහා පත් කර තිබුණු කාරක සභාව යෝජනාක්‍රමයේ අරමුණු ඵලදායීව හා කාර්යක්ෂම ලෙස ඉටු කර ගැනීම සඳහා 2016 වර්ෂයේ රැස් වීමෙන් පසු 2022 වර්ෂයේ අවස්ථා දෙකක දී, 2023 වර්ෂයේ එක් අවස්ථාවක දී හා 2024 වර්ෂයේ එක් අවස්ථාවක දී රැස්වීම හැර කාලීනව රැස්වී නොතිබුණි. කාරක සභා රැස්වීම් පැවැත්වීම පිළිබඳ නියමයන් ඇතුළත් රීති පද්ධතියක් සකස් කරගෙන නොතිබීම නිසා කාරක සභාව රැස්වීම් ක්‍රමිකව පවත්වා තිබේද යන්න පරීක්ෂා කළ නොහැකි විය.	ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ පනත මගින් උපදේශක කාරක සභා පැවැත්වීම පිළිබඳව උපදෙස් ලබා දී ඇති අතර,ඒ අනුව මණ්ඩලය විසින් අවශ්‍ය අවස්ථාවන්හිදී උපදේශක කාරක සභාව රැස්කර මණ්ඩලය අවශ්‍ය උපදෙස් ලබා ගැනීමට කටයුතු කර ඇති බව පෙන්වා දෙමි.	යෝජනාක්‍රමයේ අරමුණු ඵලදායීව හා කාර්යක්ෂම ලෙස ඉටු කර ගැනීම සඳහා කාරක සභාව කාලීනව රැස්විය යුතුය.
(ඕ)	2021 වර්ෂයේ නව බඳවාගැනීම් ආරම්භ කිරීමෙන් පසු 2025 ජුනි 20 දින වන විට ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට ගොවීන් 6,285 ක් බඳවාගෙන තිබුණු අතර පද්ධතියට තොරතුරු ඇතුළත් කිරීම පිළිබඳව නිසි අධීක්ෂණයක් නොකිරීම නිසා ජාතික හැඳුනුම්පත් අංකය, වයස, වාරිකයක වටිනාකම, වාරික ගෙවා අවසන් වන දිනය, දායකයාගේ බැංකු ගිණුම් අංකය, බැංකු ගිණුම් ශාඛාව හා විශ්‍රාම වැටුප හිමිවන දිනය ඇතුළත් නොකළ අවස්ථා පැවතුණි.	මෙම තත්ත්වයන් නිවැරදි කර ගැනීමට කටයුතු කරමින් පවතින බව පෙන්වා දෙමි. ERP පද්ධතියක් තුළින් විශ්‍රාම වැටුප් කටයුතු ආරම්භ කරන තෙක් හඳුන්වා දෙන ලද තාවකාලික දත්ත පද්ධතියක් නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ කටයුතු සඳහා භාවිතා කරනු ලබයි. මූලික දත්ත දිස්ත්‍රික් කාර්යාල විසින් ඇතුළත් කරනු ලැබුවද ඔප්පුව නිකුත් කිරීමට පෙර ප්‍රධාන කාර්යාලය මඟින් තොරතුරුවල නිවැරදිතාව පරීක්ෂා කරනු ලබයි. එහිදී ජාතික හැඳුනුම්පත් අංකය, වයස, වාරිකය හා ඊට අදාළ දින අධීක්ෂණය කරනු ලබයි.	තොරතුරු පද්ධතියට තොරතුරු නිවැරදිව ඇතුළත් කර යාවත්කාලීන කළ යුතුය.